ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - **2019/2020**

**EPC1234/ESC1134 -** භාෂා කුසලතා සංවර්ධනය

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - 2023.06.17 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

පළමු වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

## <u>පළමු වන කොටස</u>

01. පෙරපාසල් වියේ ළමයින්ගේ නිදහස් කතාබහ සංවර්ධනය සඳහා භාවිත කළහැකි ක්‍රමවේද තුනක් **(03)** ලියන්න.

02. "පෙර කියවීමේ කුසලතාවය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පන්ති කාමරයේ සිටින සවන්දීමේ දුර්වලතා සහිත දරුවෙකු හඳුනාගත හැකි ලක්ෂණ පහක් **(05)** ලියන්න.

04. පෙරපාසල් දරුවෙකුගේ භාෂා සංවර්ධනයට බලපාන නිවස ආශ්‍රිත සාධක තුනක් **(03)** ලියන්න.

05. භාෂාව ප්‍රගුණ කිරීමෙ දී පෙර පාසල් පරිසරයෙන් ළමයාට ලැබෙන ප්‍රයෝජන තුනක් **(03)** ලියන්න.

06. පෙරපාසල් වියේ දරුවන්ට ළමා කවි ගී ඉගෙනීමෙන් වන වාසි (ප්‍රයෝජන) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පෙරපාසල් වියේ දරුවන්ගේ සවන්දීමේ කුසලතා ප්‍රගුණ කිරීම සඳහා ගැළපෙන ක්‍රියාකාරකම් තුනක් **(03)** ලියන්න.

08. පෙර ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා යොදාගත හැකි ක්‍රියාකාරකම් පහක් **(05)** ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09\. (i) අවධානයෙන් සවන්දීම හුරු කිරීම සඳහා පෙර පාසලේ දී භාවිත කළ හැකි ඉගෙනුම් උපකරණ හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 08)

(ii) ඔබ ඉහත සඳහන් කළ උපකරණවලින් තුනක් **(03)** තෝරාගෙන පෙරපාසල් සිසුන් සමඟ එම උපකරණ අත්හදා බලන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 12)

10\. (i) දරුවන්ගේ කතා කිරීම පිළිබඳ ව ඇතිවිය හැකි දුර්වලතා දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) කථන දුර්වලතා සහිත දරුවන්ට උදව් කිරීම සඳහා ඔබට පෙර පාසල් පන්ති කාමරය තුළ සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් **(02)** විස්තර කරන්න. (ලකුණු 12)

11\. (i) පෙරපාසල් පන්ති කාමරයක් තුළ ළමා කතන්දර පොත් තිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පෙරපාසල් ළමුන් තුළ භාෂා කුසලතා සංවර්ධනය කිරීම සඳහා කතන්දර පොත් භාවිත කර සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් **(03)** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 15)

12\. (i) "පෙර ලිවීමේ කුසලතා සංවර්ධනය කරගත් ළමයින් හොඳින් ලිවීමට උගනිති." මෙය සත්‍යයක් ද? ඔබේ පිළිතුරට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ළමයින් තුළ පෙර ලිවීමේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් දෙකක් **(02)** සංවිධානය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13\. (i) චතුර්විධ භාෂා කුසලතා නම් කරන්න. (ලකුණු 04)

(ii) ළමා කතන්දර භාවිත කර සිසුන් තුළ චතුර්විධ කුසලතා සංවර්ධනය කරන ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

හිමිකම් ඇවිරිණි.